පොදු චක්‍ර ලේඛ අංකය: 02 - 21/2013
දිනය: 18/12/2012

# ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනී (විශේෂ ශ්‍රේණිය) රාජකාරි ලැයිස්තුව

## 1 පරිපාලනමය අවශ්‍යතා.

1.1 ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනී මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය මග පෙන්වීම් සහ යොමු කිරීම් ලබා දෙන වෛද්‍ය නිලධාරි / මාතෘ හා ළමා සෞඛ්‍ය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන දිස්ත්‍රික් තාක්ෂණික කණ්ඩායමේ සක්‍රිය සාමාජිකාවකි.

1.2 දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ඇයගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා වන අතර එම කාර්යාල සංකීර්ණයෙහිම මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ ඇය කාර්යාලය පවත්වාගෙන යා යුතුය. කාර්යාලය පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් මාලාව සඳහා ඇමුණුම 01 ලබා දී ඇත.

1.3 රාජකාරි වේලාවන්

සතියේ දිනවලදී - පෙරවරු 08.30 සිට පස්වරු 04.15 දක්වා
බදාදා දිනය කාර්යාල දිනය ලෙස සලකනු ලැබේ.

ක්ෂේත්‍ර කටයුතුවලදී මෙම රාජකාරි වේලාවන් වෙනස් විය හැකිය.

සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන් විවේක දිනයන් වේ.
සේවා අවශ්‍යතාව අනුව දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය සහිතව මෙම දිනවලද්ද රාජකාරි කටයුතුවල නිරත විය හැකිය.

1.4 ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනිය අනුමත කරන ලද ඉදිරි කාල සටහනට අනුව_රාජකාරි කටයුතු කල යුතු අතර ඉදිරි මාසය සඳහා වන වැඩ සැලැස්ම පෙර මස 25 දිනට ප්‍රථම පිටපත් 3 කින් සකස් කර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ද, එක් පිටපතක් හෙද අධ්‍යක්ෂිකා (මහජන සෞඛ්‍ය) වෙත සහ අනෙක් පිටපත තමා භාරයේ තබා ගත යුතුය.

1.5 සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් අනුව රාජකාරි කටයුතු පිළිබඳව දින පොතක් පවත්වාගෙන යා යුතු අතර මාසය අවසාන වී ඊ ලඟ මස 5 වෙනි දිනට පෙර, දින පොත දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

1.6 තම සේවා ප්‍රදේශයේ රාජකාරියෙහි යෙදෙන අවස්ථා වලදී අනුමත නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය.

## 02. සැලසුම්කරණය.

2.1 වෛද්‍ය නිලධාරි (මාතෘ හා ළමා සෞඛ්‍ය) සමග එක්ව දිස්ත්‍රික්කය සඳහා මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධන වැඩ සටහනේ සැලසුමක් සකස් කොට එය දිස්ත්‍රික් සෞඛ්‍ය සැලසුමට ඇතුලත් කිරීමට වග බලා ගත යුතුය. මෙම සැලසුම වාර්ෂික හා මධ්‍යකාලීන වශයෙන් සකස් කල යුතුය.

2.2 දිස්ත්‍රික් කණ්ඩායමේ කාර්තු සහ වාර්ෂික අධීක්ෂණ සැලැස්ම අනිකුත් දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සකස් කර ඒ අනුව කටයුතු කල යුතුය.

## 03. අධීක්ෂණය

3.1 දිස්ත්‍රික් අධීක්ෂණ සංග්‍රහයමේ සක්‍රීය සාමාජිකාවක ලෙස කටයුතු කළ යුතු අතර, පහත සඳහන් නිලධාරීන් හා ස්ථාන වල මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු ඇය විසින් අධීක්ෂණය කළ යුතුය.

- මහජන සෞඛ්‍ය හෙදි සොහොයුරියන්
- පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන්
- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන්
- සායන - මාතෘ හා ළමා සෞඛ්‍ය සායන/ පවුල් සංවිධාන සායන/ සුවනාරි සායන
- ක්ෂේත්‍ර බාර කිරීමේ මධ්‍යස්ථාන
- ක්ෂේත්‍ර

3.2 සෑම මසකම අවම වශයෙන් අධීක්ෂණ 06 ක් වත් සිදු කල යුතුය.

ප්‍රදේශයේ පවතින සේවා සැපයුම් දර්ශක අනුව, සහ නිළධාරීන් ගණන අනුව අධීක්ෂණය කරන ලද අවස්ථාවන් වෙනස් විය හැකිය.

සති දෙකක් තුලදී අධීක්ෂණ වාර්තා පිටපත් 3 කින් පිළියෙල කර, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කර ඔහුගේ නිර්දේශ සහිතව එක් පිටපතක් වෛද්‍ය නිලධාරි (මාතෘ හා ළමා සෞඛ්‍ය) වෙතටද, අනික් පිටපත අදාල නිලධාරිනියගේ ආයතන ප්‍රධානියාට ද යැවිය යුතු අතර, එක් පිටපතක් තම කාර්යාලයේ තබාගත යුතුය.

3.3 දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ආයතන අධීක්ෂණයේදී ආයතන ප්‍රධානියාගේ එකඟත්වය ඇතිව එම ආයතන වල මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු අධීක්ෂණය කළ යුතුය.

3.4 මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් සහ පරිපලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් විසින් ඉදිරිපත් කරන ලද අධීක්‍ෂණ වාර්තා සහ අධීක්‍ෂණ සැළසුම් පරීක්‍ෂා කර අවශ්‍ය මග පෙන්වීම් ලබා දී, දිස්ත්‍රික්කය තුල අධීක්‍ෂණ ශක්තිමත් කල යුතුය.

## *4.0 සුපරීක්‍ෂණය සහ ඇගයීම*

4.1 දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ සමාලෝචන රැස්වීම සංවිධානය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සක්‍රියව දායක විය යුතුය.

4.2 ප්‍රදේශයේ සිටින සියලුම මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන් සහ පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරනියන් පිළිබඳ සේවා ඇගයීමක් සිදුකල යුතුය.

4.3 දිස්ත්‍රික්කයේ ජාතික ප්‍රජනක සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සුපරීක්‍ෂණය කල යුතුය. (දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම, විශ්ලේෂණය හා ප්‍රතිපෝෂණය ලබාදීම).

4.4 ඇය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල පැවැත්වෙන මාසික සමුළු සඳහා අනිකුත් දිස්ත්‍රික් නිලධාරීන් සමඟ සැලසුම් කරගත් පරිදි සහභාගී වී අවශ්‍ය මග පෙන්වීම කළ යුතුය. එහිදී කාර්ය මණ්ඩලය වෙත නව දැනුම ලබා දීම, අධීක්ෂණ හා ඇගයීම් වලින් හඳුනාගත් ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම කල යුතුය.

4.5 තමා විසින් කරන ලද රාජකාරි කටයුතු වලදී හඳුනාගත් ගැටළු පිළිබඳව දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ සහ වෛද්‍ය නිලධාරි (මාතෘ හා ළමා සෞඛ්‍ය) සමඟ සාකච්ඡා කර විසඳුම් සොයා ගැනීමට කටයුතු කළ යුතුය.

4.6 දිස්ත්‍රික්කයේ සමීක්ෂණ කටයුතු කිරීමට අදාල වන මාතෘ හා ළමා සෞඛ්‍ය ගැටළු පිළිබඳව අධ්‍යයනය කර, ඒ අනුව අවශ්‍ය සමීක්ෂණ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට වෛද්‍ය නිලධාරී - මාතෘ හා ළමා සෞඛ්‍ය සමඟ කටයුතු කල යුතුය. තවද මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන් විසින් සිදු කරන සමීක්ෂණ හා පර්යේෂණ වලට මග පෙන්වීම කල යුතුය.

4.7 අදාල කාර්තුව තුල කාර්ය සාධන වාර්තාව පිටපත් 4 කින් සකසා අදාල පිටපත් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, අධ්‍යක්ෂ/ මාතෘ හා ළමා සෞඛ්‍ය සහ අධ්‍යක්ෂිකා /හෙද (මහජන සෞඛ්‍ය සේවා) වෙත යැවිය යුතුය.

*5.0. කාර්ය මණ්ඩල සංවර්ධනය.*

5.1 දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාල පුහුණු වැඩ සටහන් සැලසුම් කර, ක්‍රියාත්මක කළ යුතුය.

5.2 ජාතික මට්ටමේදී, මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු පිළිබඳ පුහුණු වී තම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පුහුණු වැඩ සටහන් වලදී, පුහුණු කරුවෙකු ලෙස කටයුතු කල යුතුය.

5.3 කාර්තුවකට වරක් තම අධීක්ෂණ කාර්ය මණ්ඩලය (මහජන සෞඛ්‍ය හෙදි සොහොයුරියන් /පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්) කැඳවා, ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණ කටයුතු වඩාත් ඵලදායී ලෙස සිදුකිරීමට අවශ්‍ය ක්‍රමෝපායන් පිළිබඳව දැනුවත් කල යුතුය.

5.4 අනුමත සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංශෝධන වලදී අවශ්‍යතා, පුරප්පාඩු හඳුනාගෙන මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට සහාය විය යුතුය.

5.5 තම දිස්ත්‍රික්කය තුළ පුහුණු මධ්‍යස්ථාන වල සිසු හෙදියන් හා සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ පුහුණු කටයුතුවලට සහ සේවාස්ථ පුහුණු වැඩ සටහන් වලට අවශ්‍ය සහාය ලබාදිය යුතුය.

6.0 *අනිකුත් කටයුතු.*

6.1 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගවල ප්‍රායෝගික පරීක්ෂණයේදී සභාපතිනිය ලෙසත්, වාචික පරීක්ෂණයේදී පරීක්ෂක වරියක් ලෙසත් කටයුතු කල යුතුය.

6.2 මහජන සෞඛ්‍ය හෙදි සොහොයුරියන්, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ විශේෂිත පුහුණුවීම්, උසස්වීම්, ශිෂ්‍යත්ව ආදියට නිර්දේශ කිරීමේදී, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට සහාය විය යුතුය.

6.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා තම රාජකාරී ඉටු කිරීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා අනිකුත් වෛද්‍ය ආයතනවල ඇතිවන අවශ්‍යතා හඳුනාගෙන, ඒවා ඇස්තමේන්තු කිරීමට හා සපයා දීමට වෛද්‍ය නිලධාරී (මාතෘ හා ළමා සෞඛ්‍ය) සමග එක්ව කටයුතු කල යුතුය.
(උදා: වෛද්‍ය උපකරණ, මුද්‍රිත පෝරම, එන්නත් ප්‍රවාහන සහතික)

6.4 ආපදා හා හදිසි අවස්ථාවලදී දිස්ත්‍රික් තාක්ෂණික කණ්ඩායම සමග ක්‍රියාකාරී ලෙස සහභාගී විය යුතුය. '

6.5 ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පවරනු ලබන අදාල අනිකුත් රාජකාරී කටයුතු වලද නිරත විය යුතුය.

..............................................
වෛද්‍ය එම්. විල්. ආර්. සියඹලාගොඩ
නි.සෞ.සේ. අධ්‍යක්ෂ ජනරාල්,
(මහජන සෞඛ්‍ය සේවා)

..............................................
වෛද්‍ය පී.ජී.මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම 01

## මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනියගේ කාර්යාලය පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් මාලාව

1. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ පහත සඳහන් වාර්තා වල තොරතුරු හා ලිපිගොනු පවත්වාගෙන යා යුතුය.

    1. දිස්ත්‍රික් සිතියම - ජනගහණය
       සෞ.වෛ.නි. කොට්ඨාශ
       රෝහල්
       අනිකුත් වැදගත් බිම් සළකුණු

    2 ජීව සංඛ්‍යා - ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් දැක්විය යුතුය.
       උදා: උපත් අනුපාතය
       මාතෘ මරණ අනුපාතිකය
       ළදරු මරණ අනුපාතය
       අවුරුදු 5ට අඩු මරණ අනුපාතය
       උපත් බර අඩු අනුපාතය
       පවුල් සංවිධාන ක්‍රම භාවිතයේ අනුපාතය

    3. දිස්ත්‍රික්කයේ පවත්නා රෝහල්, මාතෘ නිවාස, මධ්‍යම බෙහෙත් ශාලා සහ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පිළිබඳ විස්තර

    4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ කළාප අධ්‍යාපන කාර්යාල පිළිබඳ විස්තර

    5. එක් එක් සෞ.වෛ.නි. කොට්ඨාශ අනුව පහත සඳහන් ලිපිගොනු පවත්වාගෙන යා යුතුයි.

       a. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශ, මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ මහජන සෞඛ්‍ය හෙද සොයුරි කොට්ඨාශ සහ සායන මධ්‍යස්ථාන ඇතුලත් සෞ.වෛ.නි. කොට්ඨශයේ සිතියම

       b. ජනගහනය, සෞ.වෛ.නි. කොට්ඨාශ, මහජන සෞඛ්‍ය හෙද සොහොයුරි මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශ අනුව දැක්විය යුතුයි.

       c. සායන මධ්‍යස්ථාන (ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානද ඇතුළුව) සායන සහ සායන පැවැත්වෙන දිනයන් පිළිබඳ විස්තර

       d. සේවාස්ථ පුහුණු, මාසික රැස්වීම්, විශේෂ වැඩසටහන් දින.

       e. දිස්ත්‍රික්කයේ අධීක්ෂණ නිලධාරීන් පිළිබඳ තොරතුරු

       f අධීක්ෂණ නිලධාරීන්ගේ ඉදිරි කාල සටහන්

       g. අධීක්ෂණ කාර්ය චක්‍රය සහ අධීක්ෂණ වාර්තා

       h. අනුමත කාර්ය මණ්ඩලය, සිටින කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු ඇතුලත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු.

i.. පාසල්, පෙර පාසල්, ස්වේච්ඡා සංවිධාන, පුද්ගලික වෛද්‍ය ආයතන, ළමා නිවාස, වැඩිහිටි නිවාස හා සෞඛ්‍ය සම්බන්ධ අනෙකුත් ආයතන පිළිබඳ විස්තර.

6. පහත සඳහන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක විශ්ලේෂණය කර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් පෙර වර්ෂ 2ක් සඳහා වර්ෂිකවත් පවතින වර්ෂයේ කාර්තු සඳහාත් ප්‍රස්ථාරගත කර ඉදිරිපත් කල යුතුයි.

a) ගර්භනී මව්වරු වේලාසනින් ලියා පදිංචි කිරීම.
b) පශු ප්‍රසව සංරක්ෂණ ආවරණය.
c) පවුල් සංවිධාන ක්‍රම භාවිතයේ අනුපාතය.
d) ත්‍රිත්ව 1/ පංච එන්නත 1, සරම්ප සහ සරම්ප - රුබෙල්ලා සඳහා ප්‍රතිශක්තිකරණ ආවරණය.
e) අඩු උපත් බර අනුපාතය
f) ළදරු සහ වයස අවුරුදු 1 - 2 අතර ළමුන්ගේ බර අඩු වීමේ ප්‍රතිශතය.
g) පාසල් වෛද්‍ය පරීක්ෂණ කිරීමේ ආවරණය.
h) ගැබ් ගෙල ශ්‍රාවී පටල පරීක්ෂණය (පැප් පරීක්ෂණය) කිරීමේ ආවරණය. (ඉලක්ක වයස් කාණ්ඩයේ)

7. අධීක්ෂණ කාර්ය චක්‍රය - දිස්ත්‍රික් තාක්ෂණික කණ්ඩායම සඳහා කාර්තු පදනම් කරගත් පොදු අධීක්ෂණ කාර්ය චක්‍රයක්.

8. අධීක්ෂණ වාර්තා ලිපි ගොනුව සහ විශේෂ කාර්ය ලිපි ගොනුව